(නවවැනි පාර්ලිමේන්තුව -  සිව්වැනි සභාවාරය)

අංක **63**. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 ඔක්තෝබර් 05 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **හරීන් ප්‍රනාන්දු මහතා,** සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු ධම්මික පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

චමින්ද කුලරත්න මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: (1) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිසර අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2. **කාරක සභා වාර්තා පිළිගැන්වීම**: (1) වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 13, 14, 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 26, 31(ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ට) වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අප්‍රේල් 03 දිනැති අංක 2326/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නලින් ප්‍රනාන්දු මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ 4(1)(ඊ) වගන්තිය යටතේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 අගෝස්තු 26 දිනැති අංක 2294/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) විවෘත හා වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2022 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(ii) 2022 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය සහ ගිණුම් වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2022 වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(v) 2022 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2022 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාව;

(vii) 2022 වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(viii) 2022 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ix) 2022 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 2018, 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

3. **මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) කඩවත, සමගි මාවත, මලදොළ වත්ත, අංක 191/23, එස්.එම්.සී එන්ටර්ප්‍රයිසස් පුද්. සමාගම, යන ලිපිනයෙහි පදිංචි ආරියරත්න මාර්ටින් මහතාගෙන් ලැබුණු 2023.08.28 දිනැති පෙත්සම ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

4. **විසර්ජන:** මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2024 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2023 ඔක්තෝබර් 19 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළයුතු යැයි ද නියෝග කරන ලදී.

5. **ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩි වෙමින් පවතින්නේද යන්න සොයා බැලීමටත්, එසේ නම් ඒ සඳහා ගත යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහාත්; හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය වැඩි වෙමින් පවතින්නේද යන්න සොයා බැලීමටත්, එසේ නම් ඒ සඳහා ගත යුතු කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලීම සඳහාත්; හඳුනාගත් ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාවට නැංවීම පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහාත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2023 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2024 ජනවාරි 05 දින දක්වා දීර්ඝ කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. **ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත:—** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදි.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

"ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු රෝහණ බංඩාර මහතා, ගරු ෆයිසාල් කාසිම් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.10ට ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.51ට ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.45ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.47ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යි යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

7. **සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත:—** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදි.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

8. **සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 1):** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 13, 14, 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9. **සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 2):** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 26, 31(ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ට) වගන්තිය යටතේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අප්‍රේල් 03 දිනැති අංක 2326/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10. **නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ නියෝග:** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 3(5) වගන්තිය සමඟ කියවිය යුතු 10 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 07 දිනැති අංක 2287/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11. **"ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ (Ease of Doing Business Index) අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන**

**පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව" ස්ථාපිත කිරීම පිණිස වූ යෝජනා සම්මතය සඳහා සංශෝධනය:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2023 සැප්තැම්බර් 22 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළැඹි තීරණය පරිදි, 2022 ඔක්තෝබර් 04 දින පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද යෝජනාව මතු සඳහන් පරිදි සංශෝධනය කළ යුතු ය:—

නාමය :

නාමය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතු ය:—

"යෝජිත 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේ දී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව";

1 කොටස :

දෙවැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"කෙසේවෙතත්, දත්ත අක්‍රමිකතා හේතුවෙන් ලෝක බැංකුවේ 'ව්‍යාපාර කිරීමේ පහසුව'දර්ශකය 2021 දී අත්හිටුවන ලද අතර, 2023 මැයි මාසයේදී ලෝක බැංකුව විසින් 'ව්‍යාපාර සූදානම් (B-READY)' ශ්‍රේණිගත කිරීම් යන නාමය යටතේ නව දර්ශකය එළිදක්වා ඇති හෙයින් ද;

නව 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීම මගින් විදේශ ආයෝජන මෙරටට ආකර්ෂණය කරගැනීම මෙන්ම දේශීය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මහා පරිමාණ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මෙන්ම තරුණ ව්‍යවසායකත්වය දිරි ගැන්වීමට ඉවහල් වන හෙයින් ද;"

පස්වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"නව 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වී ඇති බව හඳුනාගෙන ඇති හෙයින් ද; සහ"

"2022 ඔක්තෝබර් 04 දින පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද යෝජනාවෙහි ඉහතින් සංශෝධනය වූ කොටස් හැර අනෙකුත් කොටස් තවදුරටත් නොවෙනස්ව පවතී."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12. **කල් තැබීම (ආහාර ද්‍රව්‍ය සඳහා නිසි ප්‍රමිතීන් නිර්දේශ කිරීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් නියෝජ්‍ය කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2023 ඔක්තෝබර් 06 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.